# ටෙන්ඩර් කැඳවීමයි

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- හම්බන්තොට

## වායුසමීකරණ යන්ත්‍ර සේවා සහ නඩත්තු කිරීම

මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණයේ ඇති වායුසමීකරණ යන්ත්‍ර 241 ක සේවා කිරීම, අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමේ කටයුතු (අවුරුද්දක කාලයක් සඳහා) වෙනුවෙන් සුදුසුකම් ලත් සහ අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචි කීර්තිමත් ආයතන/සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලැබේ.

**01. සුදුසුකම්**

අ). ලියාපදිංචි සැපයුම්කරුවකු විය යුතුය

ආ). අදාළ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවමය වසර 03ක පලපුරුද්දක් තිබිය යුතුය.

02. **ලංසු ලේඛන පරික්ෂා කිරීම හා ලබා ගැනීම**

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2026.08.05 දින සිට 2026.08.18 දක්වා පෙ.ව 9.00 සිට ප.ව 2.00 දක්වා රජයේ වැඩකරන දින හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයට පැමිණ හෝ **www.hambantota.dist.gov.lk වෙබ් අඩවියට පිවිස ලංසු ලේඛන පරික්ෂා කළ හැකි අතර, හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ සරප් වෙත ලංසු ලේඛන ගාස්තුව වන රු.1,000.00ක ගෙවීම සිදුකර ලබා ගත් රිසිට්පත සහ සම්පූර්ණ කරන ලද ලංසු අයදුම්පත සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කිරීමෙන් හෝ Govpay මගින් ගෙවීම් කර ලබාගත් රිසිට්පත 0707500916 වට්ස්ඇප් අංකයට විද්‍යුත් ලිපිනය සහ ඉහත වෙබ් අඩවියෙන් බාගත කළ ලංසු අයදුම්පත සමග ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් යොමු කිරීමෙන් ලබා ගත හැක.**

03. **පූර්ව ලංසු සාකච්ඡාව** 2026.08.12 වන දින පෙ.ව 10.00 හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන අතර, ලංසුකරුට හෝ ඔහු විසින් බලය පවරන ලද එක් නියෝජිතයකුට සහභාගී විය හැක.

**04. මිල ගණන් යොමු කිරීම හා විවෘත කිරීම**

ලංසු භාරගැනීම අවසන් වන 2026.08.19 වන දින ප.ව 2.00ට අවසන් වන අතර, එදිනට හෝ ඊට ප්‍රථම "**දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට**" යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ කුරියර් සේවා මගින් හෝ අතින් ගෙවීත් ගිණුම් අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ලංසු ලේඛන මුල් පිටපත හා අනු පිටපත ලෙස පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතු අතර ලංසු බහාලන කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි " **වායුසමීකරණ සේවා හා නඩත්තු කිරීම සඳහා මිල ගණන්**" යනුවෙනුත් සඳහන් කර තිබීම අනිවාර්ය වේ. ලංසු භාරගැනීම අවසන් වන 2026.08.19 දින ප.ව 2.00 ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් ලංසු විවෘත කරනු ලැබේ.

වැඩිදුර විස්තර දැනගැනීම සඳහා 047-2256139 අංකය ඇමතීමෙන් ලබා ගත හැක.

සභාපති<br>
දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුව<br>
හම්බන්තොට